# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2194/73 - 2020 සැප්තැම්බර් මස 25 වැනි සිකුරාදා - 2020.09.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

නියෝග අංක 69

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

20 (5) වැනි වගන්තිය යටතේ නියෝගය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 20(5) වැනි වගන්තිය මගින් සලසා ඇති විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකරමින් කිසිදු නිෂ්පාදකයකු, බෙදාහරින්නකු හෝ වෙළෙන්දෙකු විසින් පහත දක්වා ඇති අයිතමය එහි සඳහන් උපරිම සිල්ලර මිලට වඩා ඉහළ මිලකට අලෙවි කිරීම, අලෙවිය පිණිස තැබීම හෝ අලෙවිය සඳහා ඉදිරිපත් කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම සිදු නොකළ යුතු බවට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මෙයින් නියෝග කරනු ලැබේ.

| *අයිතමය* | *උපරිම සිල්ලර මිල* |
|---|---|
| වට ප්‍රමාණය අඟල් 13 ට වැඩි පොල් | ගෙඩියක් රු. 70/- |
| වට ප්‍රමාණය අඟල් 12 - 13 අතර පොල් | ගෙඩියක් රු. 65/- |
| වට ප්‍රමාණය අඟල් 12 ට අඩු පොල් | ගෙඩියක් රු. 60/- |

මෙම නියෝගය 2020 සැප්තැම්බර් මස 25 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

මේජර් ජෙනරාල් ශාන්ත දිසානායක *(විශ්‍රාමික)*
සභාපති.

2020 සැප්තැම්බර් මස 25 වැනි දින,
කොළඹ දීය.

1A - PG 5102 — 223 (2020/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*